# වාණිජ ධාරා

## වාණිජ විෂයය ගුරු සිසු අත්වැල

**(අධ්‍යාපන කාර්යාලය - බළන්ගොඩ)**

| **Business Studies** |
|---|

නිපුණතාව

12.0 : පුද්ගලයන්ගේ හා සංවිධානවල පරමාර්ථ හා අරමුණු ඉටු කර ගැනීම සඳ හා කළමනාකරණයේ අවශ්‍යතාව හා වැදගත්කම පෙන්වා දෙයි.

# කළමනාකරණය

## ඇගයීම් ගොනුව


**අනුශාසකත්වය : සුනිල් රාජපක්ෂ මහතා**

**සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ වාණිජ**

**සම්පත් දායකත්වය : වසන්ත කුරුප්පු මහතා**

**ර/ කරගස්තලාව මහා විද්‍යාලය**


**වාණිජ විෂයන් සඳහා ඉගෙනුම් ආධාරක ගොනු සැකසීමේ ව්‍යාපෘතිය**

(1) "අන් අය සමඟ සහ අන් අය මාර්ගයෙන් වැඩ කරවා ගැනීමේ **කලාව** කළමනාකරණය යි." ***(Marry Parker Follet)***
මෙම නිර්වචනයෙන් ගම්‍ය වන අදහස පැහැදිලි කරන්න.

(2) කාර්යක්ෂමතාවය සහ ඵලදායීත්වය වෙන වෙන ම හඳුන්වා, ඒ දෙක අතර ඇති අන්‍යෝන්‍ය සම්බන්ධතාවය පෙන්නුම් කරන්න.

(3) අ) සංකල්පීය, මානව සහ තාක්ෂණික කුසලතා කෙටියෙන් හඳුන්වන්න.
ආ) මානව කුසලතා වැඩි දියුණු කර ගැනීමට පුද්ගලයෙකුට ගත හැකි ක්‍රියා මාර්ග යෝජනා කරන්න.

(4) කළමනාකරුවන්ගේ පහත සඳහන් භූමිකා වලට උදාහරණය බැගින් සපයන්න.

අ) නායකයා ආ) තොරතුරු බෙදාහරින්නා
ඇ) ව්‍යවසායකයා ඈ) සම්පත් වෙන්කරන්නා

(5) සැසුම්කරණය හඳුන්වා එය සෙසු කළමනාකරණ කාර්යයන් හා සම්බන්ධ වන ආකාරය රූප සටහනකින් පෙන්නුම් කරන්න.

(6) අ) බලය සහ අධිකාරය යන සංකල්ප කෙටියෙන් විස්කර කරන්න.
ආ) කළමනාකරණයේදී බලතල බෙදීම (Delegation of Authority) යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? බලතල බෙදීම අවශ්‍ය වන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න.

(7) ඔබගේ පාසලට හෝ ඔබට සමීප වෙනත් ආයතනයකට හෝ අදාළ සංවිධාන සටහන ඇඳ පෙන්වන්න. එම සංවිධාන සටහන තුළින් පිළිබිඹු කෙරෙන කළමනාරණ මූලධර්ම නම් කර ඒවා පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්න.

(8) නායකයා කළමනාකරුගෙන් වෙනස් වන්නේ කවර කාරණා නිසාද?

(9) අ) සේවක අභිප්‍රේරණය යනු කුමක් ද?

ආ) සේවකයන් අභිප්‍රේරණය කරන මූල්‍යමය සහ මූල්‍යමය නොවන අභිප්‍රේරණ ක්‍රම වෙන වෙනම දක්වන්න.

(10) 'සැලසුම්කරණයක් නොමැති තැන පාලනයක් ද නොමැත.' මෙම ප්‍රකාශය සමග ඔබ එකග වන්නේ ද නොවන්නේ ද හේතු දක්වන්න.

**නිවැරදි පිළිතුර තෝරා ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.**

01. පහත දැක්වෙන්නේ කළමනාකරණ ශ්‍රිතවලට අයත් කාර්යයන් කිහිපයකි.

**A** ශ්‍රම විභජනය **B** පාරිසරික විශ්ලේෂණය **C** සමායෝජනය

**D** අරමුණු ස්ථාපිත කිරීම **E** කාර්යයන් හඳුනා ගැනීම **F** දෙපාර්තුමේන්තුකරණය

**G** සන්නිවේදනය

ඉහත කාර්යයන් අතුරෙන් සංවිධානකරණ ශ්‍රිතයට අයත් කාර්යයන් පමණක් ඇතුළත් පිළිතුර වනුයේ,

(1) **A,B,C,F** (2) **A,B,D,G** (3) **A,C,D,G** (4) **A,C,D,E** (5) **A,C,E,F** **(………)**

02. පහත සඳහන් වන්නේ සංවිධානයක විවිධ කළමනාකරණ මට්ටම් වලට අයත් තනතුරු කිහිපයකි.

A සුපරීක්ෂණ B අලෙවි කළමනාකරු

C මූල්‍ය කළමනාකරු D ප්‍රධාන විධායක නිලධාරී

E පර්යේෂණ හා සංවර්ධන කළමනාකරු F සුභසාධන නිලධාරී

G මානව සම්පත් කළමනාකරු H ක්‍රියාකාරී අධ්‍යක්ෂ

I නිෂ්පාදන කළමනාකරු J වැඩ මූලික

මධ්‍ය කළමනාකරණ මට්ටමට පමණක් අයත් තනතුරු ඇතුළත් කාණ්ඩය තෝරන්න.

(1) A,B,C,G,F (2) A,D,F,H,J (3) B,C,D,E,G (4) B,C,E,F,H (5) B,C,E,G,I **(……….)**

03. නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) තීරණ ගැනීමේ බලතල ඉහල කළමනාකරණය සතු වීම බලතල බලතග මධ්‍යගතකරණය යි.

(2) පාලනය ආරම්භ වන්නේ කාර්යසාධනය මැනීමෙණි.

(3) සංවිධාන ව්‍යුහය තුළින් එක් එක් සේවකයන්ගේ සුදුසුකම් පෙන්නුම් කෙරේ.

(4) පුළුල් පාලන අවකාශයක් තුළ සේවකයන් සමීපව සුපරීක්ෂණය වේ.

(5) සංවිධානකරණයේදී වඩාත් වැදගත් වන්නේ සංවිධානයේ මෙහෙවර තීරණය කිරීමයි.

**(……….)**

04. පහත වගුවේ **X** තීරුවේ කළමනාකරණ කාර්යයන් දැක්වෙන අතර ඒවාට අදාළ ක්‍රියාකාරකම් **Y** තීරුවේ දැක්වේ.

| X | Y |
|---|---|
| A. සැලසුම්කරණය | 1 කාර්යඵල මැනීම හා විචලතා හඳුනාගැනීම |
| B. සංවිධානකරණය | 2 අභිප්‍රේරණය හා සංනිවේදනය |
| C. මෙහෙයවීම | 3 අධිකාරය හා වගකීම් පැවරීම |
| D. පාලනය | 4 අරමුණු හා පරමාර්ථ ස්ථාපිත කිරීම |

**X** හා **Y** තීරු නිවැරදිව ගළපා ඇති පිළිතුර තෝරන්න.

(1) A-1, B-2, C-3, D-4 (2) A-3, B-4, C-2, D-1
(3) A-2, B-3, C-4, D-1 (4) A-4, B-3, C-2, D-1
(5) A-4, B-3, C-1, D-2 **(……….)**

05. යම් කළමනාකරුවකුට සෘජුව වාර්ථාකරන සහකරුවන්ගේ සංඛ්‍යාව හඳුන්වන සංකල්පය වන්නේ,
(1) ධූරාවලිය (Hierarchy)
(2) සංවිධාන ව්‍යුහයයි (Organizational Structure)
(3) දෙපාර්ථමේන්තුකරණයයි (Departmentalization)
(4) පාලන විතස්ථියයි (Span of control)
(5) අණකිරීමේ ඒකීයතාවයයි (Unity of Command) **(……….)**

- **නිවැරදි පිළිතුර තිත් ඉර මත ලියන්න**

06. අ) අධිකාරී බලය ස්ථාපිත වී ඇති ආකාරය අනුව සංවිධානයක් **……………………………** හා **………………….…………….** වශයෙන් වර්ග කළ හැක.

ආ) කළමනාකරුවන්ට සංයුක්ත සැකැස්මක් සකස් කිරීමේ දී මූලිකව ම තිබිය යුත්තේ **……………..** කුසලතා වන අතර අවසාන ගිණුම් සකස් කිරීමේ දී ඔවුනට **……………..…………** කුසලතා තිබිය යුතුය.

07. අ) කළමනාකරණයේ දී නිවැරදි දේ සිදු කිරීම **……………………………** වන අතර කළ යුතුදේ නිවැරදිව කිරීම **……………………………** වේ.

ආ) මින්ස්බර්ග්ගේ භූමිකා වර්ගීකරණයට අනුව කළමනාකරුවෙකු විසින් නව ව්‍යාපෘතියක් හඳුන්වා දීම **……………………………**භූමිකාවේ **……………………………** උපභූමිකාවට අයත් වේ.

08. දෙපාර්තුමේන්තුකරණය සඳහා යොදාගත හැකි පදනම් හතරක් සඳහන් කරන්න.

1………………………………………….… 2……………………………………………………

3………………………………………….… 4……………………………………………………

09. තාක්ෂණික, මානව හා සංකල්පීය කසලතා පමණක් නූතන කළමනාකරුවන්ට ප්‍රමානවත් නොවේ. ඊට අමතරව කළමනාකරුවෙකුට අවශ්‍ය කෙරෙන කුසලතා තුනක් නම් කරන්න.

1………………………………………………. 2…………………………………………………

3……………………………………………….

10. සංවිධාන සටහනකින් පෙන්නුම් කළ හැකි සංවිධාන ව්‍යුහයක ලක්ෂණ හතරක් ලියන්න.

1…………………………………………………………………………………………………..

2…………………………………………………………………………………………………..

3…………………………………………………………………………………………………..

4…………………………………………………………………………………………………..